# ලංකා කැමරා
Lanka Camera

www.lankacamera.com

2009 හිමිහාන වස්සාන ද්විත්ව කලාපය

රු.75/-



ග්‍රිෆිත් සිනමා ආඛ්‍යානය

ලක්දිව මුල් ම ඡායාරූප ශිල්ප ග්‍රන්ථය

BBC Wild Life Photographer 2009

ඡායාරූපකරණයේ ප්‍රයෝග සමෝධානය



Canon EOS 7D

**රූපවාහිනී මාධ්‍ය ආයතනයේ කාර්යක්ෂමතාව, අඛණ්ඩතාව, අරමුණු යනාදියෙහි වර්ධනයේ ප්‍රධාන කොටස්කරු වනුයේ එකී ආයතනයේ පුස්තකාලය යි. මෙකී පුස්තකාල කටයුතු අන්තර්ජාල ක්‍රමයට පවත්වා ගෙන යාම වර්තමාන තරඟකාරී මාධ්‍ය ලෝකයේ දී ඉමහත් අභියෝගයකි.**

# වීඩියෝ දත්ත සංරක්ෂණය

## පොත්ගුල් සම්ප්‍රදායෙන් මිදුණු ශබ්ද රූප කෝෂ්ඨාගාර ස්වයංක්‍රීයකරණය



[illegible] ද සිල්වා
B.A.

රූපවාහිනිය වර්තමාන මානව සන්නිවේදනයේ අතිශයින් මාධ්‍යයක් වී සිටී. 19 වන සියවස මුල්භාගය වන විට මෙලොව එළිය දුටු රූපවාහිනිය, 20 වන සියවස අග භාගය වන විට අතිශයින් දියුණු කරා ද පිය එසවීය. පින්තූර සහිත ගුවන්විදුලිය (Radio with pictures) සහ ගුවනින් එන චිත්‍රපට (Movies by air) යන නාමයන් පටබැඳී ඇති රූපවාහිනිය වර්තමානයේ ලොව පුරා තොරතුරු ඇතුළත් ව ගෙනයන ප්‍රධාන මෙවලමකි.

ශ්‍රී ලංකාවට රූපවාහිනිය හඳුන්වා දීමෙන් අනතුරුව ප්‍රථම සිට ස්වාධීන රූපවාහිනී සේවය ඇරඹිණි. 1982 ජාතික රූපවාහිනී සේවය ද රාජ්‍ය නාලිකා ලෙස ක්‍රියාත්මක වෙද්දී 1990 දශකය මුල්භාගය වන විට පෞද්ගලික නාලිකා නිර්මාණය වීම ආරම්භ විය. එම්.ටී.වී. (MTV), ටෙලිශාන් නෙට්වර්ක් (TNL), ඊ.ටී.වී (ETV), ස්වර්ණවාහිනී, සිරස ටීවී, ආර්ට් ටීවී (ART TV), ටීවී ලංකා, මැක්ස් ටීවී, යටීවී, සියත ටීවී යනා දී වශයෙන් පෞද්ගලික නාලිකා 20 කට අධික ප්‍රමාණයක් වර්තමානය වන විට නිර්මාණය වී ඇත.

ලොව වටා ඇති තොරතුරු ප්‍රේක්ෂකයාගේ අභිරුචියට සරිලන සේ ගෙන එමේ අරමුණ මුදුන් පමුණුවා ගැනීමට කටයුතු කරන රූපවාහිනී මාධ්‍ය ආයතන විවිධ වැඩසටහන්, නාට්‍ය, ප්‍රවෘත්ති මඟින් ප්‍රේක්ෂකයා වෙත ඉදිරිපත් කරනු ලබයි. මෙලෙස විකාශය කරනු ලබන විවිධ වැඩසටහන්, නාට්‍ය, චිත්‍රපට, ප්‍රවෘත්ති විකාශයෙන් අනතුරු ව තැන්පත් කර තැබීමේ අවශ්‍යතාව එකී මාධ්‍ය ආයතනයන්ට ඇති වනුයේ තරඟකාරීත්වය නිසාවෙනි. මේ හේතු කොට ගෙන, රූපවාහිනී මාධ්‍ය ආයතන සතුව පුස්තකාල නිර්මාණය වීම සිදු වේ.

රූපවාහිනී මාධ්‍ය ආයතන ආශ්‍රිත ව පුස්තකාල නිර්මාණය වනුයේ එකී ආයතනය තුළ පවත්වා ගෙන යන පොත් හෝ වීඩියෝ පටිගත ද්‍රව්‍ය තැන්පත් කිරීමේ හා සංරක්ෂණය කිරීමේ අරමුණු ඇතිව ය. මේ සඳහා එම රූපවාහිනී මාධ්‍ය ආයතනය සතු ව නොඩිනොබිල්ලෙන හෝ කුඩා කාමරයක පුස්තකාලයක් නිර්මාණය කරනු ලබයි. රූපවාහිනිය ආරම්භ වූ අවධියේ දී විකාශය වූ වැඩසටහන් විකාශන කාලය අවසන් වීමෙන් පසු ව එම වැඩසටහන අවසන් වී යළි එය නැවත නැවත විකාශය කිරීමට අවශ්‍යව නොතිබුණි. නැවත වැඩසටහන් නිෂ්පාදනයේ දී විශාල මුදලක්, කාලයක් ශ්‍රමයක් මෙන් ම සම්පත් වැයවීම නිසා වැඩසටහන් පටිගත කිරීම ආරම්භ කෙරිණි. මෙම පටිගත කැට්, පට, වීඩියෝ පට තැන්පත් කිරීමෙන් රූපවාහිනී මාධ්‍ය පුස්තකාල නිර්මාණය වූ අතර එහි කාර්යයන් ලෙස,

- විකාශයට නියමිත වැඩසටහන් තැන්පත් කිරීම.
- විකාශනය සඳහා වැඩසටහන් මුදා හැරීම.
- විකාශනයෙන් පසු වැඩසටහන් තැන්පත් කිරීම.
- තෝරාගත් කළ වැඩසටහන් පටිගත කිරීම හා ප්‍රතිසාදනය කිරීම. පෙන්වා දිය හැකි ය.

රූපවාහිනී මාධ්‍ය ආයතනයන්හි පුස්තකාල පරිසරය මැනවින් නිර්මාණය කිරීම වැදගත් වේ. රූපවාහිනී වීඩියෝ පට, කැට්, ශබ්ද පට හා කැට් වල කොහොමදෙන රාජ්‍ය භාවිතයෙන් සිරස් අතට ඇසිරිය යුතු ය. එමෙන් ම ශබ්ද පට හා කැට් තැන්පත් කිරීමේ දී 20°—23°C අතර උෂ්ණත්වයක් ද 45%-55% සාපේක්ෂ ආර්ද්‍රතාවක් ද, රූපවාහිනී පට සඳහා සෙන්ටිග්‍රේඩ් 20° ක උෂ්ණත්වයක් ද, 55% සාපේක්ෂ ආර්ද්‍රතාවක් ද පවත්වා ගෙන යාම නිර්දේශ කොට ඇත. පුස්තකාලයේ ශබ්ද පට හා කැට්, වීඩියෝ පට තැන්පත් ස්ථාන පිරිසිදු ව හා මැනවින් වාතය සංසරණය වන ආකාරයට තැබිය යුතු අතර ආලෝක පාලනය ද මැනවින් සිදු කළ යුතු ය. රූපවාහිනී මාධ්‍ය පුස්තකාල වැඩි පමණය කිරීම අත්‍යවශ්‍ය අංගයක් ලෙස පෙන්වා දිය හැකි ය.

රූපවාහිනී මාධ්‍ය ආයතනයේ කාර්යක්ෂමතාව, අඛණ්ඩතාව, අරමුණු යනාදියෙහි වර්ධනයේ ප්‍රධාන කොටස්කරු වනුයේ එකී ආයතනයේ පුස්තකාලය යි. මෙකී පුස්තකාල කටයුතු අන්තර්ජාල ක්‍රමයට පවත්වා ගෙන යාම වර්තමාන තරඟකාරී මාධ්‍ය ලෝකයේ දී ඉමහත් අභියෝගයකි. මේ නිසා මාධ්‍ය කාර්යක්ෂමතාව සඳහා පරිගණක භාවිතයෙන් පුස්තකාල කටයුතු පවත්වා ගෙන යාම හෙවත් පුස්තකාල ස්වයංක්‍රීයකරණය නිර්මාණය වී ඇත. කාලය සමඟ නිරන්තර ව ගනුදෙනු කරන රූපවාහිනී මාධ්‍ය ආයතන නිවැරදි ව හා කඩිනම් ව තොරතුරු ලැබීමේ දී එකී රූපවාහිනී මාධ්‍ය පුස්තකාල කාර්යයන් වන ප්‍රතිග්‍රහණය, සංසරණය, පටිගත කිරීම, තොරතුරු ගවේෂණය වැනි කටයුතු ඉටුකිරීමට ස්වයංක්‍රීයකරණයෙන් ඉමහත් පිටුවහලක් ලැබෙයි.

රූපවාහිනී මාධ්‍ය ආයතනයක් තුළ ස්වයංක්‍රීයකරණ පරිසරයක් ගොඩනැඟීමේ දී පරිගණක තාක්ෂණය මැනැවින් යොදා ගත යුතු ය. පරිගණක පද්ධතියක්, බාකෝඩ් රීඩර් (Barcode Reader) මෙන් ම වෙනත් දෘඩාංග උපකරණ යොදාගැනීමෙන් ස්වයංක්‍රීයකරණය මැනවින් භාවිතයට අවස්ථාව උදා වේ.

නමුත් වර්තමානය වන විට ද රූපවාහිනී මාධ්‍ය ආයතන පුස්තකාල ස්වයංක්‍රීයකරණය තවමත් ප්‍රාරම්භක මට්ටමක පවතින බැව් පෙනේ. ශ්‍රී ලංකාවේ ඇතැම් රූපවාහිනී මාධ්‍ය ආයතන Winisis, පූර්ණ වැනි මෘදුකාංග